මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - මාලිම්බඩ
மாலிம்பட பிரதேச சபை - மாலிம்பட
MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA

දිනය :- 2022.04.18
திகதி :-
Date :-

දූ.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2022.04.07 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 අප්‍රේල් මස මාසික සභා රැස්වීම 2022.04.07 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

### *01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.*

2022 මාර්තු මස 08 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව 2022.03.08 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

## *02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන*

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක මාර/පපාසකො/ආ07/01/05 හා 2022.03.18 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය සභා සභිකයන්ගේ ඉන්ධන දීමනාව වැඩි කිරීමේ හාකියාවක් නොමැති බවට දැනුම් දීල තියෙනවා.

## *03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.*

- තෙලිජ්ජවිල, හොරගොඩ, අලුත්හේන , 86/ඒ හි එල්.කේ.තුෂාර චන්දන යන අය විසින් එවන ලද "හොරගොඩ පාසල අසලින් ඇති කනත්ත පාර සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, ගල්ඇන්දකුට්ටිය, රන්තරු මිතුරු හවුල විසින් එවා තිබූ "සේනානි මංසන්ධිය ආසන්නයේ ඇති සමරුගල මංසන්ධියේ බුදුමැදුරක් සාදා ගැනීම සම්බන්ධව " හවන ලද ලිපිය සභාගත කරන ලදී.
- සුල්තානාගොඩ, අකුරුගොඩ, නැටැව්වවත්ත හි එන්.වී.අජිත් පුෂ්ප කුමාර යන අය විසින් එවා තිබූ "මාර්ගය අවහිර වීමක් සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

## *04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත*

## *05. යථා පරිදි කල්දී ඇති යෝජනා*

**<u>යෝජනා අංක 5:1</u>**

2022/02/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/02/23 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/03/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/03/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

1. කොට්ඨාස මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම මත පහත සඳහන් යෝජනා සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

   I. මැදගොඩ ප්‍රජා ශාලාවේ වැසිකිළිය සහ ආරක්ෂිත දැල් වැට ඉදිකිරීම

II. හොරගොඩ නැගෙනහිර පොකුණුමුල්ල පාර සංවර්ධනය කිරීම.

III. ඇල්ගිරිය ඉහලවත්ත ගොඩැල්ල පාර සංවර්ධනය කිරීම

IV. දම්පැල්ල කුරුඳුවත්ත මැද පාර සංවර්ධනය කිරීම.

V. අධිකාරිවිලගම සමගි මාවත සංවර්ධනය කිරීම.

VI. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන මාරගහහේන ප්‍රජා ශාලාව ඉදිකිරීම.

VII. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන කැකුණවෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම.

VIII. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන වෙළෙඳගොඩ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

IX. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

X. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන නාගොඩ අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

XI. වෙනිඅකුල ආයුර්වේද මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අලුතින් කොටසක් ඉදිකිරීම.

XII. හොරගොඩ බතලෝවිට වේල්ලපාර සංවර්ධනය කිරීම.

XIII. සුල්තානාගොඩ කොබෙයිගනේ හේන ඉඩමේ (මනම්පේරි හෝම්ලැන්ඩ්ස්) ඉඩමේ අත්පන්දු ක්‍රීඩාංගනයක් ඉදිකිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා</u>**

මෙම යෝජනාවේ අංක I මගින් දැක්වෙන යෝජනාව මැදගොඩ ප්‍රජා ශාලාවේ වැසිකිළිය සහ මිදුල සකස් කිරීම ලෙස සංශෝධනය කරන්න.

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**

සභාපතිතුමා සමහර කොට්ඨාසවලට ලක්ෂ 20 යි.සමහර ඒවාට පහයි, දෙකයි.අපි මුදල දාන්න හොඳ නෑ.ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ මේව දාන්න කියල අපි අනුමැතියක් දුන්නේ නැහැනේ. සභාවේ සල්ලි තියෙනවද?

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
මන්ත්‍රීතුමා අපි කථා කළා කොට්ඨාසෙ කාටත්ම ලක්ෂ 20 ගානේ වෙන්කරන්න. ගත්ත යෝජනා ටිකනේ මේ යන්නෙ. ඔබතුමාගේ කොට්ඨාසෙට ලක්ෂ 30 ක් විතර යනවා.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>
මම සභාපතිතුමාට කිව්වනේ සුල්තානාගොඩ ක්‍රීඩාංගණයට කරුණා කොඩිතුවක්කු මහතා මුදල් වෙන්කරල තියෙන්නෙ කියලා. ඒක ඕන නෑ. මාස තුනකට විතර කලින් කාණුවකට සහා යෝජනාවක් දැම්මා. ක්‍රීඩාංගණයට මාස 06 කට විතර කලින් පැති බැම්මකට යෝජනාවක් දැම්මා.ඒවා කෙරුන්නෑ.අපේ කොට්ඨාසෙ වැඩ කෙරෙන්නෑ.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
ඔයාගේ පැතිබැම්මට ඇස්තමේන්තුව ලක්ෂ 28 ක්. ඒක හදල තියෙන්නෙ. මම ඔක්කෝටම කිව්වා ඇස්තමේන්තු හදවගෙන තමන්ගේ කොට්ඨාසෙ වැඩ කරගන්න කියලා.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>
සභාපතිතුමා මට යම් අසාධාරණයක් වුණා. අපි දෙන්නගෙ පාරවල් විතරයි අන්තිමට අනුමත වෙලා ආවේ. ඒකත් නොවැම්බර්වල. දෙසැම්බර් 31 වැඩ ඉවර කරන්න කියල කොළේ අතට එනකොට රටේ සිමෙන්ති අර්බුදයයි, අනිත් ප්‍රශ්නයි ඇවිත් ඉවරයි. නමුත් ඇස්තමේන්තු හරි හදල තිබුණානම් ඒ පාරෙ වැඩ කරගන්න තිබුණා.ව්‍යා පෘති හදාගන්න බැරිවුණු පාරවල්වලට ආපු සල්ලි යනකන් බලන් ඉඳලා ආපහු සභාවෙන් සල්ලි දානවා. මොනවද සභාපතිතුමා මේ වැඩ. සභාපතිතුමා මෙතන ඉඳන් කොච්චර කිව්වත්, මන්ත්‍රීතුමා කියන එක හරි. මෙතන වැඩ ටික වෙන්නෙ නෑ.ඔය ගැටලු ටික සභාවේ තියෙනවා.

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>
සභාපතිතුමා මන් දන්නෑ ඔබතුමා දන්නවද නැද්ද කියලා. නිලධාරීන් යන්නෙ නෑ. මම නෙමෙයි විපක්ෂෙ මන්ත්‍රී කෙනෙක් කිව්වත් නිලධාරීන් මේව බලන්න ඕන.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මන්ත්‍රීතුමා මේක අපි කොළඹ ගිහින් කථාකරල කාටත් කිව්වා වැඩ කරන්න කියලා.නාලක මන්ත්‍රීතුමා, දිස්නා මන්ත්‍රීතුමිය, සාගර මන්ත්‍රීතුමා වැඩ ටික කරානේ. මම ගියා ද? නෑ. කොන්ත්‍රාත්කාරයො ගත්තෙ නෑ. ඉතින් මම මොකද්ද කරන්නෙ. මම හැමදාම කියනවනේ TO මහත්වරු අල්ලගෙන ඇස්තමේන්තු හදාගෙන කර්මාන්ත ටික කරන්න කියලා. කාටවත්ම මම බලපෑම් කරල නෑ කරන්න එපා කියලා. පාරවල් ටිකත් එක්ක නම් ගහල දුන්න TO මහත්වරුන්ට මේ ටික කරන්න කියලා. මගේ පැත්තෙන් මම වැඩ කරල තියෙන්නෙ. නිරන්තරයෙන් සොයා බැලුවා. අපි කොච්චර ප්‍රශ්න තියෙද්දි වැඩ කරාද? උත්සාහ ගත්ත අය වැඩ කරගත්තා.

<u>ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා</u>
අද දින න්‍යාය පත්‍රය බැලුවම සභාපතිතුමාගේ යෝජනා ඇරෙන්න වෙනත් කිසිම මන්ත්‍රීවරයෙක්ගෙ යෝජනා නැහැ. ඒකට හේතුව විදියට මම නම් දකින්නෙ වෙනත් මන්ත්‍රීවරු යෝජනා ඉදිරිපත් කරල කරල ක්‍රියාත්මක නොවන කොට මට වුණත් යෝජනාවක් ඉදිරිපත් කරන්න හිතෙන්නෑ.ඒ හේතුව මත කියලයි මගේ විශ්වාසය. එසේම සභාපතිතුමා දාන යෝජනා ක්‍රියාත්මක වෙනවා අපි දැකලා තියෙනවා. ඒ නිසා තමයි මේ සියලු යෝජනා සභාපතිතුමා නමින් දාලා තියෙන්නෙ. ඒ වගේ තමයි සභාපතිතුමා අපි දන්නවා දවසේ පැය 24 න් බොහෝ කාලයක් සභාවේ කටයුතු කරනවා. ඉතා හොඳින් වැඩ කටයුතු කරන බව අපි

දන්න කාරණාවක්. එතුමාගේ කැපවීම තුළ ලොකු වැඩ කොටසක් කෙරෙනවා. නමුත් අපි ඉදිරිපත් කරපු යෝජනා ක්‍රියාත්මක නොවන බව තමයි මෙතෙක් කථා කළ මන්ත්‍රීවරුන්ගෙ අදහස. ඒක සනාථ වෙනවා 2017 වසරේ මේ සභාවට ආපු විමධ්‍යගත සල්ලි අද වෙනකන් ඉවත් කරගන්න බැරි වෙලා තියෙනවා. අද අහනවා මේ සල්ලි ආපු ලියුමක්වත් තියේද කියලා. මගේ අවුරුදු දෙක තුනක ලිපි ලේඛන හොයල අද මම අරගෙන ආවා 2017 ආපු ලියුමේ පිටපතක්. හැබැයි ඒකට අපි ඇස්තමේන්තු හදන්න කියලා TO මහත්තයට කිහිප වරක් කතා කරාට විවිධ හේතු මත ප්‍රමාද වුණා. දැන් එතුමා කියනවා ඒ ලියුම ඕනෙයි කියලා. හැබැයි මීට පෙර අපි ඒ ආපු මුදලින් වැඩ දෙක තුනක් කරා. ඒ වෙලාවේ ඒ ලියුම හෙවුවෙ නෑ වැඩ කරා.
සභාපතිතුමනි අපි සමහර වෙලාවට වැඩක් කථා කරගෙන දිනයක් දාගත්තම TO මහත්තය කියනවා අද එන්න විදියක් නෑ සභාපතිතුමා තව වැඩක් පැවරුවා කියලා.බොහෝ වෙලාවට සිදුවන්නේ ඒක. සභාපතිතුමාගේ කාරණාව ප්‍රමුඛ වුණාම අපේ කාරණා පස්සට යනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු යෝජනා අපිට කරගන්න බැරිවුණා. ඒව ගැන පසු විපරමක් කරල අපේ සභා අරමුදලින් හෝ අරමුදල් නැතිවත් කරගන්න පුළුවන් යෝජනා තිබුණා. අපි සභාපතිතුමාට චෝදනා කරන්නෙ නෑ. අපි වැඩ කරන්න ආසයි. අපි දක්ෂයි කියල ඔබතුමාම පිළිගන්නවා. එහෙනම් ඇයි අපිට වැඩ කරන්න දෙන්නැත්තෙ. ඔබතුමාගේ වරදක් නෙමෙයි මෙතන තියෙන්නෙ යාන්ත්‍රණයේ වරදක්. මම ඉල්ලීමක් කරනවා මේ නිලධාරීන්ට ලිඛිතව වැඩ පවරන්න කියලා. මේ වැඩේ මේ කාලසීමාවට පෙර කරන්න කියන්න. ඒකට ඔබ තුමාට බලය තියෙනවා. නෛතික පසුබිමත් තියෙනවා. වැඩ කෙරෙන්නැත්නම් ඔබතුමාට පසු විපරමක් කරන්න පුළුවන්කම තියෙනවා. ඔබතුමා කටින් කියනවා කරන්න කියලා ඒ වුණාට කෙරෙන්නෑ. ඒ නිසා සභාපතිතුමා අපි කියන කාරණාව තේරුම් ගන්න. ඔබතුමාටවත් නිලධාරීන්ටවත් චෝදනා කරනවා නෙමෙයි. මේ යාන්ත්‍රණයේ වැරැද්දක් තියෙනවා වැඩ කටයුතු කඩිනමින් නොකෙරෙන. ඒක හොයල ඒකට වැඩ පිළිවෙළක් හදනවනම් අද අපි කවුරුත් සතුටින් සභාවට එන්නෙ. අපි ඇවිල්ල ඒ අපේ කාරණාව ඉටු නෙවෙන කොට අපි යන්නෙ හිතේ වේදනාවෙන්. තමන්ගෙ කොට්ඨාසයේ වැඩ කෙරුණනම් මේ මන්ත්‍රීවරු ඒ කොට්ඨාසයේ ඉන්නේ බොහොම සතුටෙන්. හොරගොඩ මහා විද්‍යාලය ළඟ කරුණා කොඩිතුවක්කු මහතාගේ ප්‍රතිපාදන යටතේ ඉදිකරපු වොලිබෝල් කෝඩ් එකට යන තැන පාරෙ මුල ටික අඩි 10 ක කොටස අද වැඩ කරගන්න බැරිවෙලා තියෙනවා. මන්ත්‍රීතුමා යෝජනාවක් දාලා TO මහත්තය මැනගෙන ඇවිල්ලත් දැන් මාස 06 ක් විතර වෙනවා. ඒ පොඩි වැඩේ නිසා අපිට ලොකු හානියක් වෙනවා. මේ වගේ පොඩි වැඩක්වත් මන්ත්‍රීවරුන්ට කරගන්න බෑ කියලා මිනිස්සු දොස් කියනවා. සභාවෙන් අපිට වැඩ කරගන්න බෑ කියලා අපිට කියන්න බෑ. අපි එතනදි නිහඬ වෙනවා.
ඔබතුමා ලක්ෂ 20 බැගින් කොට්ඨාසවලට වෙන් කරන කොට මේ පොඩි වැඩ නොකිරීම නිසා අපිට ලොකු හානියක් වෙනවා. ඒ වගේ තමයි අපේ මොනව හෝ හේතු නිසා මාර්ග සංවර්ධන අධිකාරියෙන් වෙන් කරපු වැඩ යෝජනා ප්‍රමාද වීම මත අපි කරපු වැඩ වලටත් මේ වෙනකොට මුදල් නොලැබෙන තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා. අපිට තාම කියන්න බෑ මේ මුදල් ලැබෙයිද කියලා. එවැනි තත්ත්වයක් තුළ සභාවෙ තියෙන මුදල් ටික තවදුරටත් වියදම් කරල ඒ මුදල් ටිකත් ඉවර කරන්නැතිව මම යෝජනා කරනවා පුළුවන්නම් ඒ කොන්ත්‍රාත් කරුවන්ට ඒ මුදල් වලින් කොටසක් හරි ගෙවල ඒ මිනිසුන්ට සහනයක් සලසන්න කියලා. මොකද තව මාස ගාණක් ගිහිල්ල මේ මුදල් ලැබුණොත් අද වනවිට රුපියලේ පවතින අගයත් එක්ක ලක්ෂ පහේ කර්මාන්තයට ඊට වඩා අඩු වටිනාකමක් තමයි ලැබෙන්නේ. ඒ ගැනත් අවධානය යොමුකරන්න කියන ඉල්ලීම කරමින් මේ අතපසු වෙච්ච වැඩ ටික ක්‍රමවේදයක් හදල දින වකවානුවක් නිශ්චිත කරගෙන කරගන්න අවස්ථාව දෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

උදයසාන්ත මනිත්‍රීතුමා කරපු කථාවේ එකක්වත් මම භාර ගන්නේ නෑ. උදයසාන්ත මන්ත්‍රීතුමා කතාකරන්න ගියාම කතා කරනවා. වැඩ කිරීමේදී වැඩ නොකෙරුනු හේතු කිහිපයක් තියෙනවා. මන්ත්‍රීතුමා මුලින්ම බුද්ධිමත් විදියට හිතන්න. මේක මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට විතරක් වෙච්ච දෙයක් නෙමෙයි. අපි මෙහෙම හරි කරනවා. සමහර සභා එකක්වත් කරල නෑ.

තිහගොඩ විතරයි සම්පූර්ණ පාරවල් වැඩ කරල තියෙන්නේ. තව ඒක ඇරෙන්න මාතර දිස්ත්‍රික්කයේ කිසිම සභාවක් වැඩ කරල නෑ. එහෙම වැඩ කරල තියෙද්දි අපි මෙහෙම වැඩ කරපු එක ගැන ඔබතුමන්ල සතුටු වෙන්න. ඒත් මම මේක කරන්න මොනතරම් උත්සාහ ගත්තද?. මම මන්ත්‍රීවරුන් එක්ක කොළඹ ගියා. කොළඹ ගිහින් අමාත්‍යාංශ ලේකම්වරු හමුවුණා. මාස දෙකකට අපි කල් ගත්තා. ඒ සඳහා ඉල්ලීමකුත් අරන් ආවේ. මේ සියලු කරුණු මන්ත්‍රීවරු දන්නවා. එහෙම කරපු අයටනේ මේ චෝදනා දාන්නේ. මට හරි කණගාටුයි. මම ඇරෙන්න වෙන කිසිම කෙනෙක් ඒකට උත්සාහ ගත්තෙ නෑ. හැම මන්ත්‍රීවරයෙකුටම කිව්වා වැඩ ටික කරගන්න කියලා. ඒ විතරක් නෙමෙයි තාක්ෂණ නිලධාරීන් දෙදෙනා ලොකු සහයෝගයක් දුන්නා. එහෙම නැත්නම් මෙච්චර වැඩ කොටසක් කර ගන්න බෑ. දැන් සමහර පාරවල් සම්බන්ධව බරපතල ප්‍රශ්න ඇවිත් තියෙනවා. වුවමනාවක් තිබුණ කෙනෙකුට මේව කරගන්න තිබුණා. වාර්තාවල ලියවිලා තියෙනවා. කොන්ත්‍රාත්කරුවන් සමහර කර්මාන්ත ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වුණේ නෑ. එහෙම තත්ත්වයක් නිසයි මේක ප්‍රමාද වුණේ. ඒ නිසා හොඳට හොයල බලල කතා කරන්න.

**<u>තීරණ අංක 5:3</u>**

1. කොට්ඨාස මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම මත පහත සඳහන් යෝජනා සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

I. මැදගොඩ ප්‍රජා ශාලාවේ වැසිකිළිය සහ මිදුල සකස් කිරීම

II. හොරගොඩ නැගෙනහිර පොකුණුමුල්ල පාර සංවර්ධනය කිරීම.

III. ඇල්ගිරිය ඉහලවත්ත ගොඩැල්ල පාර සංවර්ධනය කිරීම

IV. දම්පැල්ල කුරුඳුවත්ත මැද පාර සංවර්ධනය කිරීම.

V. අධිකාරිවිලගම සමගි මාවත සංවර්ධනය කිරීම.

VI. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන මාරගහහේන ප්‍රජා ශාලාව ඉදිකිරීම.

VII. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන කැකුණවෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම.

VIII. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන වෙළෙඳගොඩ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

IX. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

X. ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලත් ලබාගෙන නාගොඩ අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

XI. වෙනිඅකුල ආයුර්වේද මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අලුතින් කොටසක් ඉදිකිරීම.

XII. හොරගොඩ බතලෝවිට වේල්ලපාර සංවර්ධනය කිරීම.

XIII. සුල්තානාගොඩ කොබෙයිගනේ හේන ඉඩමේ (මනම්පේරි හෝම්ලෑන්ඩ්ස්) ඉඩමේ අත්පන්දු ක්‍රීඩාංගනයක් ඉදිකිරීම.

**යෝජනා අංක 5:4**

පුස්තකාල පහසුකම් අඩු මට්ටමක පවතින පාසල්වල පාසල් මට්ටමින් ජංගම පුස්තකාල සේවාවක් ආරම්භ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

සමහර පාසල් තියෙනවා පුස්තකාල පහසුකම් නැති. පොත්පත් නැති. අපිට සේවකයො වැඩියෙන් ඉන්නවා. ඒ නිසා අපේ සේවකයොන්ට එවැනි පොඩි පාසල් වලට ගිහිල්ල පුස්තකාල පොත්ටික දෙන්න භාර දෙනවා. ඒ පාසල් වලට අවශ්‍ය පොත් අපි සභාවෙන් මිලදී ගෙන පාසල් මට්ටමින් ඒවා හුවමාරුකරගැනීමක් කරනවා. එහිදී අවම වශයෙන් මාසයකට වරක්වත් එක පාසලකට යන්න බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:4**

පුස්තකාල පහසුකම් අඩු මට්ටමක පවතින පාසල්වල පාසල් මට්ටමින් ජංගම පුස්තකාල සේවාවක් ආරම්භ කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:5**

අකුරුගොඩ පුවක්දොළ ඉඩමේ යෝජිත ආදාහනාගාරය ඉදිකරන ස්ථානයට යන මාර්ගය සහ භූමිය සභා අරමුදලින් සැකසීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

එතන පාරත් එක්ක ගෙපල සකස්කිරීම තමයි ඒකෙ බලාපොරොත්තුව.එතන කැලේ වගේනෙ තියෙන්නෙ.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:5**

අකුරුගොඩ පුවක්දොළ ඉඩමේ යෝජිත ආදාහනාගාරය ඉදිකරන ස්ථානයට යන මාර්ගය සහ භූමිය සභා අරමුදලින් සැකසීමට තීරණය විය.

**යෝජනා අංක 5:6**

තෙලිජ්ජවිල පොදුවෙළඳපොළ කඩකාමර 05 හි තක්සේරු කාලය සම්පූර්ණ වී ඇති බැවින් නව තක්සේරුවක් සිදු කිරීමට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:6**

තෙලිජ්ජවිල පොදුවෙළඳපොළ කඩකාමර 05 හි තක්සේරු කාලය සම්පූර්ණ වී ඇති බැවින් නව තක්සේරුවක් සිදු කිරීමට තීරණය විය.

**යෝජනා අංක 5:7**

**ප්‍රාදේශීය සභා රැස්වීම් කාර්යය පටිපාටියේ 11(5) අනුව 2022/02/08 වන දින පැවති මහා සභාවේ අංක 6.4 යෝජනාව පරිච්ඡින්න කිරීම සඳහා වූ පහත සඳහන් යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් ගරු උප සභාපති,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්දුල දික්මාදූගොඩ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත මුණසිංහ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නාලක යන සභිකයින් හතර දෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කිරීම.**

ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩර් ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.වී.අමිල් උෂාන්ත මහතා විසින් කරන ලද ඉල්ලීම අනුව, ඔහුගේ දෛනික දීමනාව වැඩි කිරීමට ගරු සභාවට යෝජනා කරමු.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රි ගයාන් සමන්ත නාදකන්ද මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ රියදුරෙකු වන ඒ.වී.අමිල් උෂාන්ත මහතා කොන්ත්‍රාත් පදනම මත බැකෝ ලෝඩර් ක්‍රියාකරුවෙකු ලෙස 2016/08/24 දින සේවයට බඳවාගෙන තියෙනවා. එහිදී දෛනිකව රු.1300.00 ක දීමනාවක් ගෙවීමට තීරණය කරල මේ දක්වාම ඒ දීමනාවම ඔහුට ගෙවනවා.ජීවන වියදම් ඉහළ යාම මත මෙම දීමනාව ප්‍රමාණවත් නොවන බැවින් සහ බැකෝ ලෝඩර් ක්‍රියාකරුවන් ඉහල වැටුපක් ලැබුවත් එම වැටුපෙන් ¼ කටත් අඩු දීමනාවක් තමන් ලබන නිසාත් තම දෛනික දීමනාව වැඩි කරන ලෙස ඔහු ඉල්ලීමක් කරල තියෙනවා. සභාවේ සිටින එකම බැකෝ ලෝඩර් ක්‍රියාකරු ඔහු නිසාත්, හදිසි ආපදා අවස්ථාවලදී සහ මාර්ග සංවර්ධනයේදී අති මහත් සේවාවක් මොහු විසින් සිදුකරන නිසාත් මෙම රියදුරුගේ දෛනික දීමනාව දිස්ත්‍රික් මිළ ගණන් කමිටු වාර්තාවට අනුව ලබාදිය හැකි අවම දීමනාව වන රු.2000.00 ක මුදලක් බැගින් ලබා දීමට යෝජනා කරනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:7**

ජීවන වියදම් ඉහළ යාම මත ඒ.වී.අමිල් උෂාන්ත මහතාට ලබා දෙන දීමනාව ප්‍රමාණවත් නොවීමත් , සම මට්ටමේ රියදුරන් ඉහළ වැටුපක් ලැබීමත් සලකා සභාවේ සිටින එකම බැකෝ ලෝඩර් ක්‍රියාකරු ඔහු නිසාත්, හදිසි ආපදා අවස්ථාවලදී සහ මාර්ග සංවර්ධනයේදී අති මහත් සේවාවක් මොහු විසින් සිදුකරන නිසාත් , මෙම රියදුරුගේ දෛනික දීමනාව දිස්ත්‍රික් මිළ ගණන් කමිටු වාර්තාවට අනුව ලබාදිය හැකි අවම දීමනාව වන රු.2000.00 ක මුදලක් බැගින් ලබා දීමට තීරණය විය.

ගරු මන්ත්‍රි පිටිදුව ගමගේ විමලවංශ මහතා පෙ.ව.11.00 ට සභා රැස්වීමට සහභාගී විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**යෝජනා අංක 6:1**
සතියකට දින තුනක් වැටුප් ලබා දින 5ක් සේවය කරමින් සහ වැටුප් නොලබා දින දෙකක් සේවයේ යෙදී සිටින ඩී.ඩබ්.මධූෂා කුමාරි යන අයට දින පහක වැටුප් ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

ඩී.ඩබ්.මධූෂා කුමාරි යන අය සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමාගේ නිර්දේශය ලබාගෙන තීරණයක් ලබා දෙන තෙක් දින 05ක් සඳහා වැටුප් ගෙවීම අනුමත නොකිරීමට පසුගිය සභාවේදී තීරණයක් ගත්තා.ඒ අනුව මේ වනවිට ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරී විසින් ඩී.ඩබ්.මධූෂා කුමාරි යන අයගේ දින 5 ක සේවය සහතික කරල එවල තියෙනවා.එම නිසා සතියකට දින 5ක් සඳහා වැටුප් ගෙවීමට යෝජනා කරනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:1**

ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරී විසින් ඩී.ඩබ්.මධූෂා කුමාරි යන අයගේ දින 5 ක සේවය සහතික කර ඇති බැවින් එම වාර්තාව මත සතියට දින 05 ක් සඳහා ඇය වෙත වැටුප් ගෙවීමට තීරණය විය.

**යෝජනා අංක 6:2**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ඕගස්පේ සුසාන භූමියෙහි භස්මාවශේෂ තැන්පත් කිරීම සඳහා අවසර ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**
ඕගස්පෙ සුසාන භූමියෙ මිනී අළු තැන්පත් කිරීම සඳහා අපෙන් ඉල්ලීමක් කරල තියෙනවා. මම මේකට අවසර දුන්නෙ නැහැ සභාවත් එක්ක සාකච්ඡා කරල තීරණයක් ගන්න ඕන නිසා. මොකද මේ පළමුවෙනි වතාවට තමයි මෙවැනි ඉල්ලීමක් ආවේ. අපි ඒක කොහොමද දෙන්නේ? අපිට ඕනනම් එක තීරුවක් දීල අඩියෙ අඩි දෙකේ වගේ කොටුවක් වෙන් කරල දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා**
තාප්පයක් ගහල ඒක වටේට දෙන්න. ඒකට ආදායමක් ගන්න පුළුවන්.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**
තාප්ප ගහන්න ලොකු වියදමක් යනවා. අපි දැනට අයිනක් වෙන් කරල එතන වල බඳින්නැතිව අළු තැන්පත් කරන්න දෙමු. රු.500.00 ක් 1000.00ක් වගේ ගාස්තුවක් අය කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:2**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ඕගස්පෙ සුසාන භූමියේ සභාවේ වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ, සභාව විසින් පෙන්වා දෙන නිශ්චිත කොටසක අඩි 2x2 ප්‍රමාණයේ කොටුවක වළ බැඳීමකින් තොරව භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා අවසර ලබා දීමටත්, එහිදී රු.1000.00 ක ගාස්තුවක් අය කිරීමටත් තීරණය විය.

ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා සහ ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය පෙ.ව.11.40 ට සභා රැස්වීමට සහභාගී විය.

**යෝජනා අංක 6:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී අයකරන ගාස්තුව සංශෝධනය කිරීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

වර්තමානයේ ඉන්ධන වියදමයි වාහන කොටස් මිළයි ගත්තම අපට ජේ.සී.බී.යන්ත්‍රය කුලියට දීමේදී අයකරන ගාස්තුව වැඩි කරන්න වෙනවා. පිට අය දැන් රු.4000.00 ක් අය කරනවා. අපි මේක අඩුවෙන් දුන්නම අපිට තියෙන ඉල්ලුම වැඩි වෙනවා. ඒ නිසා ගාස්තුව වැඩි කරමු.

**ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා**

ට්‍රාන්ස්පෝට් එකටත් ගාණක් අයකරන්න.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී පැයක් සඳහා අයකරන ගාස්තුව රු.3800.00 ක් දක්වා වැඩි කිරීමටත්, ගමන ආරම්භ කළ ස්ථානයේ සිට මීටරය ගණනය කිරීමටත් තීරණය විය.

ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය පෙ.ව.11.45 ට සභා රැස්වීමට සහභාගී විය.

**යෝජනා අංක 6:4**

ග්‍රාම නිළධාරී වසම්වලට වෙන් කරන ප්‍රතිපාදන සඳහා ප්‍රමුඛතාගත කරන ලද සංවර්ධන යෝජනා ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 2022 පොදු පහසුකම් සංවර්ධනය කිරීම යටතේ සභාව මගින් ඉටුකිරීමට යෝජිත පහත කර්මාන්ත අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

| ග්‍රාම නිලධාරී වසම | යෝජනාව | වෙන් කර ඇති මුදල |
|---|---|---|
| සුල්තානාගොඩ නැගෙනහිර | කැකිල්ල ප්‍රධාන මාර්ගය අසල සිට මහවත්ත හරහා පරගහ කුඹුරු යාය දක්වා (500m) සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| සුල්තානාගොඩ දකුණ | දිග්ගස්ගොඩ වෙරිගෙවත්ත මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| හොරගොඩ බටහිර | කඩේගෙදරවත්ත කන්දට යන පාරේ එච්.ජී.උපුල් මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව සිලින්ඩරයක් යොදා සැකසීම | රු.50,000.00 |
| හොරගොඩ නැගෙනහිර | කුරුඳුවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| ගල්පමුණ | ගල්පමුණ ප්‍රජා ශාලාවේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| ගල්පමුණ | එගොඩයමුල්ල ප්‍රියන්ත නන්දන මහතාගේ නිවස අසල සිට ලලිත් චන්ද්‍රකුමාර මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය | රු.500,000.00 |

| | | |
|---|---|---|
| | සංවර්ධනය කිරීම. | |
| මාරගොඩ | දම්පැල්ල මහා විද්‍යාලයේ ගේට්ටුව අසල හියුම් පයිප්ප යොදා කාණුව සකස් කිරීම. | රු.100,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | අත්මගහේන මාර්ගය සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | අධිකාරිවිලගම රන්තරු මාවත සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| කිරිමැටිමුල්ල උතුර | කිරිමැටිමුල්ල කැරැන්තොල්ල මාර්ගයේ පී.එල්. ගුණදාස මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීම | රු.400,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | සපුමල් මාවත 1 හරස් මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම | රු.200,000.00 |
| තෙලිජ්ජවිල | සමරෙගෙවත්ත ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම | රු.180,000.00 |
| කටුවන්ගොඩ | කටුවන්ගොඩ කුඩාදූව මාර්ගය සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| හොරගොඩ නැගෙනහිර | පාතෙගම පොකුණුමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම | රු.300,000.00 |
| අකුරුගොඩ බටහිර | වැසිකිළි ඉදිකිරීම(පවුල් 03 ක් සඳහා) | රු.150,000.00 |
| ගලවා ඉවත් කරන ලද කැටගල් ඇල්ලීම<br>ගැමුණු මාවත නිශ්ශංක මහතාගේ නිවස අසල(කටුකුරුන්ද වත්ත)-මාලිම්බඩ බටහිර සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා බල මණ්ඩලය | | රු.210,000.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

ග්‍රාම නිළධාරී වසම්වලට වෙන් කරන ප්‍රතිපාදන සඳහා ප්‍රමුඛතාගත කරන ලද සංවර්ධන යෝජනා ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති- 2022 පොදු පහසුකම් සංවර්ධනය කිරීම යටතේ සභාව මගින් ඉටුකිරීමට යෝජිත පහත කර්මාන්ත අනුමත කිරීමට තීරණය විය

| ග්‍රාම නිලධාරී වසම | යෝජනාව | වෙන් කර ඇති මුදල |
|---|---|---|
| සුල්තානාගොඩ නැගෙනහිර | කැකිල්ල ප්‍රධාන මාර්ගය අසල සිට මහවත්ත හරහා පරගහ කුඹුරු යාය දක්වා (500m) සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| සුල්තානාගොඩ දකුණ | දිග්ගස්ගොඩ වෙරිගෙවත්ත මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| හොරගොඩ බටහිර | කඩේගෙදරවත්ත කන්දට යන පාරේ එච්.ජී.උපුල් මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව සිලින්ඩරයක් යොදා සැකසීම | රු.50,000.00 |
| හොරගොඩ නැගෙනහිර | කුරුඳුවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| ගල්පමුණ | ගල්පමුණ ප්‍රජා ශාලාවේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| ගල්පමුණ | එගොඩයමුල්ල ප්‍රියන්ත නන්දන මහතාගේ නිවස අසල සිට ලලිත් චන්ද්‍රකුමාර මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | රු.500,000.00 |
| මාරගොඩ | දම්පැල්ල මහා විද්‍යාලයේ ගේට්ටුව අසල හියුම් පයිප්ප යොදා කාණුව සකස් කිරීම. | රු.100,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | අත්මගහේන මාර්ගය සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | අධිකාරිවිලගම රන්තරු මාවත සංවර්ධනය කිරීම | රු.500,000.00 |
| කිරිමැටිමුල්ල උතුර | කිරිමැටිමුල්ල කැරැන්තොල්ල මාර්ගයේ පී.එල්. ගුණදාස මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීම | රු.400,000.00 |
| කිරිමැටිමුල්ල දකුණ | සපුමල් මාවත 1 හරස් මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම | රු.200,000.00 |
| තෙලිජ්ජවිල | සමරෙගෙවත්ත ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම | රු.180,000.00 |
| කටුවන්ගොඩ | කටුවන්ගොඩ කුඩාදූව මාර්ගය සංවර්ධනය කිරීම. | රු.500,000.00 |

| | | |
|---|---|---|
| හොරගොඩ නැගෙනහිර | පාතෙගම පොකුණුමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම | රු.300,000.00 |
| අකුරුගොඩ බටහිර | වැසිකිළි ඉදිකිරීම(පවුල් 03 ක් සඳහා) | රු.150,000.00 |
| ගලවා ඉවත් කරන ලද කැටගල් ඇල්ලීම<br>ගැමුණු මාවත නිශ්ශංක මහතාගේ නිවස අසල(කටුකුරුන්ද වත්ත)-මාලිම්බඩ බටහිර සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා බල මණ්ඩලය | | රු.210,000.00 |

**<u>යෝජනා අංක 6:5</u>**

SPRC-8579 අංක දරණ ට්‍රැක්ටරයේ තිරිංග අක්‍රිය වී ඇති බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

බ්‍රේක් වැඩ කරන්නැතිව තිබිල කලින් අපට හදල ගෙනත් දුන්නනේ. විමල් ඇග්‍රෝ ආයතනයේ වගකීම් කාලය අවසන් වෙලා තියෙන නිසා ප්‍රාදේශීය ගරාජයක් වෙත යොමු කරල මිලගණන් ලබා ගන්න කියලා යාන්ත්‍රික ඉංජිනේරුතුමා නිර්දේශ කරල තියෙනවා. අපේ ලියාපදිංචි වෙලා තියෙන ට්‍රැක්ටර් හදන ආයතන එකයි තියෙන්නෙ. මිළ ගණන් කැඳෙව්වා. අපි ඒකට දාමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

SPRC-8579 අංක දරණ ට්‍රැක්ටරයේ තිරිංග අක්‍රිය වී ඇති බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා සභාවේ ලියාපදිංචි වී ඇති ඕගස්පේ ගරාජය වෙත යොමු කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගබඩාව ඉදිරිපිට ඇති විවෘත ඉඩකඩ යොදාගෙන නවක නිළධාරීන් සඳහා කාමරයක් සකස් කිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගබඩාව ඉදිරිපිට ඇති විවෘත ඉඩකඩ යොදාගෙන නවක නිළධාරීන් සඳහා කාමරයක් සකස් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා ජෙනරේටරයක් මිලදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා ජෙනරේටරයක් මිලදී ගැනීමට තීරණය විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු කොම්පෝස්ට් අංගනයේ පිහිටි දිරාපත් වූ ඇස්ටෝනියා ගස් සඳහා වූ ප්‍රාදේශීය ටෙන්ඩර් කැඳවීම 2022.03.21 දින පැවැත්වූ අතර එම කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම.

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු.**

<u>**ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා**</u>

හොරගොඩ නාපේ ජේ.එල්.කුලතුංග යන අය විසින් අනතුරුදායක ගස් වගයක් ඉවත් කිරීම සඳහා ලියුමක් එවල තිබුණා.තාක්ෂණ නිලධාරීතුමා සමග ගිහින් වාර්තාවක් ඉදිරිපත් කරල තියෙනවලු. සභාපතිතුමා ඒකට අනුමැතිය දුන්නෙ නෑ කියල කියනවා.

<u>**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**</u>

ඒක අපට කරන්න බැරි දෙයක්. මොකද ඒක පුද්ගලික පාරක්. අපි එයාට විස්තරේ කියලා යැව්වා. එයත් පිළිගත්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරගන්න පුලුවන් කියලා. අපිට පනතෙ බලතල තියෙන්නෙ නිවාසවලට හා ජීවිතවලට අනතුරුදායක ගස් ඉවත් කරන්න විතරයි. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිර්දේශයක් යැව්වා මේක අනතුරුදායකයි මේක කපා ඉවත් කරන්න කියලා. එයාට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඒක කරගන්න පුලුවන්.

<u>**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**</u>

සභාපතිතුමනි අපට එවල තිබුණා සංවර්ධන යෝජනා සඳහා කියලා ප්‍රජා ශාලාවල් මාර්ග ලැයිස්තුවක්. එතකොට සභා අරමුදලින්ද ඒව කරන්නේ කියල දැනගන්න ඕන. මොකද ප්‍රජා ශාලාවක් හදන්න ලක්ෂ 40 ක් විතර යනවා මං හිතන්නේ. ඇස්තමේන්තු හදලද? ඒව අද සභාවට ඉදිරිපත් කරනවද?

<u>**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**</u>

මේ යෝජනාවනේ අනුමැතියට දාලා තියෙන්නේ. යෝජනාව අනුමත වුණාම ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා.

<u>**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**</u>

සභාවේ ගිණුමේ කොච්චර මුදල් තියේද කියලා ලබන සභාවේදී අපට කියන්න. මේ වෙනකොට කරපු වැඩ භාගෙට නැවතිලා තියෙනවා කරගන්න බැරිව. චක්‍රලේඛ එවල තියෙනවා ඉදිකිරීම් සහ බඳවා ගැනීම් කරන්න එපා කියලා. මොකද රටේ මූල්‍ය අර්බුදයක් තියෙන බව අපි දන්නවා. රටේ මෙච්චර ප්‍රශ්නයක් වෙලා තියෙනවා. සභාවේ අඩු ගානේ හදිසියකට ජෙනරේටරයක් නෑ. ගලි බවුසරයක් නෑ. අන්න ඒ වගේ දේකට මේ මුදල් දැම්මනම් හරි. සංවර්ධනය කරන්න පටන් ගනිපු පාරවල් තියෙනවා මිනිසුන්ට යන්න එන්න බැරිව. ඒවට මුදල් නැතිව ඒව නතරවෙලා තියෙනවා. අන්න ඒ නතර වෙලා තියෙන වැඩ ටික ඉවර කරනවනම් ගැටලුවක් නැහැ. අලුත් එකක් පටන් ගන්න එක කාලෝචිත නෑ. වෙලාවේ හැටියට පඩි ගෙවා ගන්නත් බැරි තත්ත්වයක් තියෙන්නේ. දූප්පත්ම රට ලංකාව වෙලා තියෙනවා මේ වෙනකොට. එහෙම වෙලාවක අපේ සභාවේ තියෙන මුදල් ටික අලුත් යෝජනා දාලා ඉවර කරාම මේ සභාවේ පැවැත්ම ගෙනියන්න බැරි වෙනවා. දැන් රටට වෙච්ච දේ සභාවටත් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම කියන්නේ අවස්ථාවාදී විදියට නැතිව කරපු වැඩටික ඉවර කරන්න. අපි මේ තරහකට නෙමෙයි කියන්නෙ. ඒ නිසා නවත්තපු වැඩ ටික පටන් අරන් ඒක ඉවර කරන්න.

<u>**ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා**</u>

විපක්ෂනායකතුමා කිව්ව වගේ දැන් මුදල් අමාත්‍යාංශයෙන් පොදු චක්‍රලේඛයක් නිකුත් කරල තියෙනවා නව ඉදිකිරීම් සහ බඳවා ගැනීම් නතර කරන්න කියලා. ඒ ගැන හොයල බලල ඒ චක්‍රලේඛය අනුගමනය කරන්න කියල ඉල්ලනවා. පළාත් ප්‍රධානීන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන්ට ඒක දන්වල තියෙනවා.
දෙවැනි කාරණාව සභාපතිතුමා, අපි දිගින් දිගටම ජල ව්‍යාපෘතිය ගැන කතා කළා.මට ආරංචියක් ඇවිල්ල තියෙනවා එම ව්‍යාපෘතිය විගණන අංශයෙන් අධිභාරයට ලක්වෙලා කියලා. කරුණාකරල ඒ ගැන අපිව දැනුවත් කරන්න. මන්ත්‍රීවරුත් මේකට ඉන්නවද කියලා අපි දැනගන්න ඕන.
අනිත් කාරණාව තමයි සභාපතිතුමා අද න්‍යාය පත්‍රයේ තිබෙන ප්‍රජා ශාලාවල් සහ ඉදිකිරීම් සම්බන්ධව වැඩ යෝජනා අනුමත කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නෑ. ඒ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට කලින් ඒවා ප්‍රයෝජනවත්ද කියලා කාර්මික නිලධාරියයි, ප්‍රජා සංවර්ධන නිලධාරී, පරිසර නිලධාරී සහ සුදුසු අය සම්බන්ධ කරල ශක්‍යතා අධ්‍යනයක් කරන්න. ඒ වාර්තාව සභාවට ඉදිරිපත් කරන්න. සමහර ප්‍රජා ශාලා අපි ඉදිකරල තියෙනවා ඒ වුණාට කිසි ප්‍රයෝජනයක් නෑ. ප්‍රජා ශාලාවලට තියෙනවා ගම සමග පිළිසඳර වැඩ සටහන යටතේ 2019 දී අනුමත වූ රු.ලක්ෂ 12 ලබා ගෙන කියලා. එක කර්මාන්තයකට ආයතන දෙකකින් වියදම් කරන්නෙ කොහොමද කියල විගණන ගැටලුවක් ඇතිවෙනවා. ඒ නිසා මධ්‍යම ආණ්ඩුවෙන් කොපමණ දෙනවද? පළාත් සභාවෙන් කොපමණ වියදම් වෙනවද කියලා කියන්න. රජයේ පොදු චක්‍රලේඛයක් තියෙනවා එකම කර්මාන්තයට දෙපාර්තමේන්තු දෙකකින් අනුග්‍රහය දක්වන්න බෑ කියලා. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරල කටයුතු කරන්න කියල ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>

අපේ රජයෙන් කොන්ක්‍රීට් දාලා කාණු හදල තියෙනවා ලක්ෂ ගාණක් වියදම් කරල. දැන් මේ කාණු හතර පස් තැනකින්ම ගොඩකරල තියෙනවා. මිනිස්සුන්ට ගෙවල් වලට යන්න බැරි නිසා මිනිස්සු බලෙන් වගේ කාණු ගොඩ කරල තියෙනවා. ඒක අනිවාර්යෙන් හොයල බලන්න. මේක හදල ඉවර කරන්න කියල ඒ කොන්ත්‍රාත්කාරයොන්ට කියන්න. අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් තමයි අපි පත් කරල තියෙන්නෙ. අපිට අහක බලන් ඉඳල යන්න බැහැ. වහාම පරීක්ෂණයක් පවත්වන්න කියල ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා</u>

මිනිස්සු පුද්ගලිකව ගොඩකරගත්ත නෙමෙයි. RDA එකට කතා කරල RDA එකේ ජේ.සී..බී.එකක් ගෙන්නගෙන තමයි ගෙවල්වලට යන්න පාරවල් සකස් කර ගත්තෙ. මිනිස්සු හිතුමතේ කරගත්තු දෙයක් නෙමෙයි. එහෙම කරගත්තු සමහර අයත් ඇති. මිනිස්සු ගැන වරදක් පටවන්නෙ නැතිව ඔබතුමාගෙ අවධානෙ යොමුකරන්න. වාහනයක් යන්න බැරිව මාසයක් විතර තිබුණට පස්සෙ තමයි ගොඩ කරල තියෙන්නෙ.

<u>ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා</u>

හොරගොඩ ප්‍රදේශයේ ජනතාවගේ සහ මහජන නියෝජිතයන්ගේ ඉල්ලීමත් ඔබතුමාගේ අනුමැතියත් මත හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත පුළුල් කිරීම සිදුකළා. එය සිදුකළ යන්ත්‍රයට මුදල් ගෙවීම මේ වනතෙක් සිදුකර නැහැ.
අප සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය අක්‍රිය වී තිබීම හේතුවෙන් පිටතින් යන්ත්‍රයක් යොදා පාර පුළුල් කිරීමට 2022/01/11 දින සභා තීරණයක් ගෙන ඇති බැවින් අදාළ මුදල කඩිනමින් ගෙවීමට කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

සභාවට දැනුම්දීල නැහැ මේ සංවර්ධන කටයුතු නවත්වන්න කියලා. ඒ නිසා අපට වගකීම තියෙන්නෙ යම්කිසි කොට්ඨාසයක වැඩක් කරන කොට කොට්ඨාසයේ මන්ත්‍රීවරයාගේ

අනුමැතිය අරගෙන කරන්න. ඒ නිසා අපි මන්ත්‍රීවරුන්ගේ අනුමැතිය මත තමයි මේ යෝජනා ටික සකස්කළේ. මගේ තනි කැමැත්තට නෙමෙයි කාගෙත් ඉල්ලීම මත. ඊළඟට මන්ත්‍රීතුමා අපට සභාවේ මුදල් තියෙනවා. අපි මුදල් අර්බුදයක් ඇතිවෙන්න ඉඩ තියන්නෑ. එහෙම කරල අපි යන්නෑ. සභාව අපි ශක්තිමත් විදියට තියනවා. අපි ආදාහනාගාරය සකස් කිරීමට ණය මුදලක් ගන්නවා. ප්‍රාදේශීය සභාව අර්බුදකාරී තත්ත්වයකට පත් කරන්නෙ නෑ. කම්කරුවන්ට මුදල් ගෙවිය යුතු ආකාරය අපි සියල්ල සැලසුම් කරල තියෙන්නේ.
බාගෙට නැවතිච්ච ව්‍යාපෘති පළාත් සභා අමාත්‍යාංශයේ වගකීමක්. පළාත් පාලන අමාත්‍යාංශයෙන් අපට ඒ මුදල් ටික ලැබෙනවා. එහෙම ප්‍රශ්නයක් වුණොත් ඒ ටික ගෙවන්න අපිට සභාවේ මුදල් තියෙනවා.
ජල ව්‍යාපෘතියේ අධිභාර අයකිරීමක් නෑ. හැමදාම එක එක දේවල් වලට විගණන විමසුම් එනවා. අපි ඒක නිවැරදිකරල යැව්වම, පැහැදිලි කරාම හරි. අධිභාරයක් ඇවිල්ල නෑ. අපෙන් විමසීමක් කරල තියෙන්නෙ. අපි ලබන සභාවේදී සම්පූර්ණ විස්තරයක් දෙන්නම්.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>
ඉඩම් වෙන්දේසියේදී අපි දැක්කා සභාපතිතුමා දැන්වීමක් ප්‍රදර්ශනය කරල තියෙනවා ඉඩම් වෙන්දේසියේ ඉඩම් මිළදී ගන්න එපා කියලා. මේ වෙනකොට මොකද්ද වෙලා තියෙන්නේ.එයාල ප්ලෑන් එකක් ඇඳල සභාවට දෙන කොටස් වෙන් කරලද?

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
එතන කැබලි කරල විකිණීමක් වෙන්නෙ නෑ. කෘෂිකාර්මික කටයුතු සඳහා අනුමත කර ගැනීමක් කරන්නෙ. සභාවේ අනුමැතයක් දීල නෑ. කමිටුවේ අනුමැතිය මත තමයි අනුමත කරන්නේ.
<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>
අපේ සභාවේ තීරණයක් ගන්න සියලු මන්ත්‍රීවරුන් මෙකට අකමැතියි කියලා.

<u>ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය</u>
කැකුණවෙල ගබඩගෙවත්ත මාර්ගය සකස් කරල දෙන්න කියල ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>
මන්ත්‍රීතුමියගේ පාර සෑදීම සුදුසුයි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>
TO මහත්තයට කියල ඇස්තමේන්තු හදාගන්න.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව